**ගාල්ල මහා නගර සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද නගරාධිපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය රු.6,164,842 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාරව ඉතුරුම් ගිණුමට බැර කළයුතු වූ රු.1,049,977 ක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.528,308 ක් වූ ආයුර්වේද ඉතිරි තොගය ගිණුම් ගතකර නොතිබුණි. | වර්ෂ අවසාන තොගය ගිණුම් ගතකළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | දේශීය ණය සහ සංවර්ධන අරමුදල් වාරික ගෙවීමේ දී රු.331,635 ක් වැඩිපුර ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ගලිබවුසරයක් මිලදී ගැනීමට 2002 වර්ෂයේ ලබාගත් රු.2,074,972 ක ණය මුදල සහ මහජන වැසිකිළියක් ඉදිකිරීමට | ණය මුදල ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට |

| | | | |
|---|---|---|---|
| | 2005 වර්ෂයේ ලබාගත් රු.641,526 ක ණය මුදල ගිණුම් ගතකර නොතිබුණි. | | කටයුතු කරමි. |
| (vi) | මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | විගණන ගාස්තු ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | වර්ෂයේ ලොතරැයි කුට් 45 ක් බෙදුදීම වෙනුවෙන් ලැබීම් රු.393,791 ක් වැඩියෙන් දැක්වීම නිසා ලැබිය යුතු ලොතරැයි කුට් ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | කාර්යාල ඉඩකඩ සහ මහා නගර සභා ආපනශාලා ආදායම රු.262,610 ක් අඩුවෙන් බිල් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.103,673,560 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.9,173,110 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2003 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කර ගත යුතු වේ. | ඉදිරියේ දී නිරවුල් කරමි. |

**(ඇ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට වසර 05 කටත් අධික කාලයක සිට පැවත එන එකතුව රු.49,396,381 ක් වූ ගිණුම් ශේෂ 06 ක් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |

**(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,091,777,767 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | යාවත්කාලීන කර, විධිමත් පරිදි ලේඛන පවත්වා ගත යුතු වේ. | ඉදිරියේ දී ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.178,438,560 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.198,808,270 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) වසර 2 ක සිට පැවත එන රු.192,088 ක් වූ අගරු චෙක්පත් 13 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම රු.55,474 ක් වූ අගරු චෙක්පත් සම්බන්ධව තොරතුරු සභාව සතුව නොතිබුණි. | තොරතුරු සොයා ගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කරමි. |
| (ආ) පොදු ගිණුමට අදාළ මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු.2,836,395 ක් වූ නමුත්, දෙසැම්බර් මස බැංකු සැසඳුම අනුව එදිනට මුදල් පොත අනුව ශේෂය රු.1,973,292 ක් වූයෙන් මුදල් ශේෂයේ රු.4,809,687 ක වෙනසක් විය. | වෙනසට හේතු සොයා නිරවුල් කරගත යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 111,510,000 | 106,365,583 | 105,113,546 | 142,355,829 | 83,010,000 | 90,149,355 | 100,394,779 | 137,776,385 |
| හා බදු කුලී | 105,582,275 | 48,236,132 | 42,975,003 | 26,184,809 | 80,292,000 | 33,403,743 | 43,777,996 | 28,588,585 |
| බලපත්‍ර ගාස්තු | 42,104,000 | 37,150,353 | 36,326,845 | 9,468,570 | 33,004,000 | 14,663,088 | 40,214,605 | 11,537,062 |
| වෙනත් ආදායම් | 158,007,000 | 170,068,921 | 84,220,934 | 8,237,753 | 540,675,000 | 119,737,551 | 343,683,541 | 296,555,871 |
| | 417,203,275 | 361,820,989 | 268,636,328 | 186,246,961 | 736,981,000 | 257,953,737 | 528,070,921 | 474,457,903 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.836,278,892 ක් වුවද, රැස් කළ ආදායම රු.268,636,328 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 32 ක් වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවට අයත් දේපල 06 කින් සමාලෝචිත වර්ෂයේ බිම් බදු හා එළදා බදු ලෙස රු.306,700 ක් බිල්කර තිබූ නමුත්, කිසිදු මුදලක් වර්ෂය තුලදී අය නොකිරීම නිසා වර්ෂය අවසානයට එම දේපලවලට අදාළව රු.1,173,046 ක හිඟ ශේෂයක් විය. හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධව මහා නගර සභා ආඥා පනතේ 251 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.3** වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට වරිපනම් බදු බිල් කිරීම රු.86,423,624 ක් වුවද, ලද ආදායම රු.48,219,320 ක් වූයෙන් වාර්ෂික බිල් කිරීම්වලින් අය නොවූ ආදායම රු.38,204,304 ක් හෙවත් සියයට 44 තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | රතු නිවේදන නිකුත් කර ඇති අතර, ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ඉකුත් වර්ෂය අවසානයට රු.123,707,646 ක් වූ හිඟ වරිපනම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ රු.31,834,101 ක් පමණක් අය කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.91,873,545 ක් තවදුරටත් හිඟව පැවතුණි. ආරම්භක හිඟ ශේෂයෙන් අයකිරීම් සියයට 26 ක තරම් අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.4** කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.26,184,809 ක හිඟ කුලී ශේෂයක් පැවති අතර, එය අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නීති ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) **කඩ කාමර බදුදීම** | | |
| කඩ කාමර 179 කින් 2018 දෙසැම්බර් 31 දිනට රු.5,186,918 ක බදු මුදලක් හිඟව පැවතිය ද, හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගනිමි. |

**2.3.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.9,468,570 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 170(අ)(10) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගනිමි. |

**2.3.6 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු මුළු ආදායම රු.466,624,792 ක් වුවද රැස්කළ ආදායම රු.84,220,934 ක් හෙවත් සියයට 18 තරම් අඩු අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව 2013 ජූලි 02 දින හෝ ඊට පෙර එම ව්‍යාපෘතිය අවසන් කළ යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විටද වැඩ අවසන් කර නොතිබුණි. නමුත් ගිවිසුම් ගත මුදලට අමතරව රු.2,026,950 ක් වැය කර තිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර සභාවේ කාර්යයන් සඳහා යොදවා ගත යුතු වේ. | දත්ත ලබා ගැනීම තවදුරටත් සිදු කරමි. |

(ඇ) **අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියේ ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිලි සැලසුම් සඳහා අය කරන ලද ආවරණ අනුමත ගාස්තු නගර සභාවට අයත් ඉතුරුම් ගිණුමක තැන්පත් කර ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදාගත හැකි නමුත්, ඉතුරුම් ගිණුමේ වූ රු.5,830,583 ක ශේෂය සංවර්ධන කටයුතු වලට යොදා ගැනීමෙන් තොරව පැවතුණි. | අදාළ මුදල් සංවර්ධන කටයුතු සඳහා දායක කරගත යුතු වේ. | ඉදිරියේදී ව්‍යාපෘති සඳහා යොදවා ගනිමි. |

(ඇ) **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.8,855,676 ක් ගෙවිය යුතු වුවත්, වැට් ඇතුලත්ව රු.15,129,632 ක් ගෙවීම නිසා රු.273,956 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු දී නොමැත. |
| (ii) | 2018 පෙබරවාරි 14 දින නිරීක්ෂණයේ දී අතුරා තිබූ කොන්ක්‍රීට් සාම්පල් වල ප්‍රමිතිය අසමත් වී තිබුණි. | අසමත් වූ වැඩ විෂයය නිවැරදි කරගෙන ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු වේ. | පිළිතුරු දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iii) | රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මඟින් ලබා දුන් වෘත්තීය වාර්තාව අනුව ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් කණුවල කම්බි මළ කෑමට ලක්වීම නිසා එම කණු සඳහා යකඩ කණු යොදා ශක්තිමත් කර නොතිබුණි. | නිවැරදි කර ගැනීම කළ යුතු වේ. | පිළිතුරු දී නොමැත. |
| (iv) | ආලින්ද කොටසේ කොන්ක්‍රීට් කණු සහ තට්ටුව පුපුරා ඇති බැවින් ඊට ප්‍රථම ව්‍යුහාත්මක යෝග්‍යතාවය හා ශක්තිය පිළිබඳව වෘත්තීය නිර්දේශයක් ලබාගත යුතුව තිබුණි. | වෘත්තීය නිර්දේශයක් ලබා ගතයුතු වේ. | පිළිතුරු දී නොමැත. |
| (v) | ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා 2018 වර්ෂයේ අවසන් මාස 02 හි ආදායම අහිමි වී තිබුණි. | කඩිනමින් ව්‍යාපෘතිය අවසන් කර, සහා ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු දී නොමැත. |

**(ඉ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 ගැසට් නිවේදනය හා 2017 මැයි මස පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කරන ලද ලිපියෙන් ඉදිරිපත් කළ මාර්ගෝපදේශය අනුව සණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | අදාළ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළයුතු අතර, පසු විපරම් කටයුතු සිදුකළ යුතු වේ. | ඉදිරියේ දී ඒ සම්බන්ධව කටයුතු කරමි. |

**(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | පිළිතුරු දී නොමැත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ක්‍රීඩාපිටිය බදු දීම**<br>ගාල්ල මහා නගර සභා ක්‍රීඩා පිටිය 2008 අප්‍රේල් 20 සිට 2018 අප්‍රේල් 19 දක්වා කාලපරිච්ඡේදයට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දීමේ දී ගිවිසුමකට එළඹ නොතිබුණි. | ගිවිසුම්ගත විය යුතු වේ. | ඉදිරියේ දී ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |
| **(ආ) ගිනි නිවීමේ ඒකකය**<br>ගිනි නිවීමේ සේවා සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලැබිය යුතු රු.398,267 ක් වසර 05 කටත් අධික කාලයක් අය නොවී පැවතුණි. එසේම ගිනි නිවීමේ ඒකකයට අදාළව සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කර, අනුමත කර ගැනීමට වසර 20 ක් තුළ කටයුතු කර නොතිබූ අතර, ඊට අදාළව සුදුසු සේවා මුර ක්‍රමයක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමටත්, එම ඒකකයට අදාළ සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කිරීමක් කළ යුතුවේ. | 2019 වර්ෂයේ නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට කටයුතු කරමි. |
| **(ඇ)** දේපල බදුදීම<br>සභාවට අයත් බදු දේපල 05 ක් සමාලෝචිත වර්ෂයේ බදුදීමට කටයුතු කර නොතිබූ අතර, එමගින් සභාවට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂවල බදු දීම වෙනුවෙන් එකතුව රු.2,556,143 ක ලැබිය යුතුව තිබූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකරගත යුතු අතර හා බදු දියහැකි දේපල බදු දිය යුතු වේ. | ඉදිරියේ දී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) **නිල නිවාස**<br>සභාව සතු ලේඛන ප්‍රකාරව නිල නිවාස 21 පැවති අතර, නිල නිවාස 03 ක් අලුත්වැඩියා කළයුතු මට්ටමේ පැවතුණි. නිල නිවාස 03 ක් කඩා ඉවත් කර තිබුණි. නිල නිවාස 02 ක නාගරික වෙළඳ කුටි සඳහා සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා යොදාගෙන තිබූ බැවින් නිල නිවාස 08 ක් අරමුණුගත කාර්යයන් සඳහා යොදවාගෙන නොතිබුණි. | නිල නිවාස අළුත්වැඩියා කර, අරමුණුගත කාර්යයන් සඳහා යොදවා ගත යුතු වේ. | ඉදිරියේ දී ලේඛනයක් නඩත්තු කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් අතිරික්තව බඳවාගෙන තිබූ සේවකයින් 113 දෙනෙකු විධිමත් කර ගැනීමටත් පුරප්පාඩු 123 ක් සඳහා විධිමත් පරිදි සේවකයින් බඳවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමටත් අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |
| (ආ) | වර්ෂය අවසානයට ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, මිය ගිය හා වැඩ තහනම් සේවකයින් 33 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,775,753 ක ණය ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. | ලිපි යවා ඇත. ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.399,443,462 ක වත්කම් හා රු.66,474,278 ක ගබඩා තොග ශේෂයක් පැවති නමුත්, දිගින් දිගටම වත්කම් ලේඛන හා තොග ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් හා තොග ලේඛන යාවත්කාලීන කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |

**3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිනි නිවීමේ ඒකකය තුළ පැවති වාහනයක් භෞතික පරීක්ෂාවේ දී කාර්මික දෝෂ සහිත බැවින් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ගිනි නිවීමේ ඒකකයේ ඇති වාහන ක්ෂණිකව පනගැන්විය හැකි ආකාරයට ක්‍රියාත්මක තත්ත්වයේ තබා ගතයුතු බැවින් නියමිත කාලාන්තර වලදී පරීක්ෂා කර ක්‍රියාත්මක තත්ත්වය තහවුරු කර ගැනීම සම්බන්ධව සභාවට අවධානය යොමු වී නොතිබුණි. | නියමිත කාලාන්තරයන් වලදී පරීක්ෂා කර කාර්මික දෝෂයන් හඳුනාගෙන අළුත්වැඩියා කරගත යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභා සීමාවෙන් පිටත ගිනි නිවාරණ සහතික නිකුත් කිරීමේ දී අය කරන ගාස්තුවෙන් සියයට 50 ක මුදලක් අදාළ සේවකයන්ට ලබාදීමත්, ගිනි නිවන හටයින් පුහුණු කරන ගාස්තුවෙන් 2/3 ක ප්‍රමාණයක් එම පුහුණුව ලබාදෙනු ලබන නිලධාරීන්ට ගෙවීම සිදු කර තිබුණි. | දීමනා ගෙවීම සඳහා විධිමත් අධිකාර බලයක් තිබිය යුතු වේ. | සභා තීරණ අනුව ගෙවීම් සිදු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් වල එකතුව රු.160,558,967 ක් වූ අතර, එම අගයන් සියයට 29 සිට සියයට 82 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම, විගණන වාර්තා නිකුත් කිරීම හා අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදීම සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර පාලන ක්‍රම ඇතිකර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |